සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE

**තෙවන වාර පරීක්ෂණය - 2021**

| 10 ශ්‍රේණිය | දෙවන බස සිංහල | කාලය පැය 03 යි |
|---|---|---|

නම/ විභාග අංකය :- ..............................................................................................................................

## I කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න වල තද කළු අකුරින් මුද්‍රිත පදය වෙනුවට කටවහරින් යෙදෙන වචනය සහිත පදය තෝරන්න.**

(1) **මාත්තෙක්ක** සෙල්ලම් කරන්න එන්න.

(1) මාත් තෙක්ක (2) මමත් එක්ක (3) මාත් එක්ක (4) මා තෙක්ක

(2) රහස **කියන්නෙපා.**

(1) කියන්නේපා (2) කියන් එපා (3) කියන්නේපා (4) කියන්න එපා

(3) **අයියත් එක්ක** මමත් ගමන යන්නම්.

(1) අයියත්තෙක්ක (2) අයිය එක්ක (3) අයියතේක්ක (4) අයියද්දෙක්ක

(4) මෙතැන **බලන් ඉන්නේ** ඇයි?

(1) බලායින්නේ (2) බලං ඉන්නේ (3) බලන්නින්නේ (4) බලානින්නේ

(5) අපි හෙට ගමට **යන්නෝනැ**

(1) යන්නෝනැ (2) යන්නෝ නැ (3) යන්න නේනැ (4) යන්න ඕනැ

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරෙන් නිවැරදි උච්චාරණය සහිත පදය තෝරන්න.**

(6) (1) ප්‍රජා සාලාව (2) ප්‍රජා ෂාලාව
(3) ප්‍රජා ශාලාව (4) ප්‍රජා සාළාව

(7) (1) මුගුණුඇන්න (2) මුකුණුවැන්න
(3) මුගුනුඇණ්ණ (4) මුගුණුවැන්න

(8) (1) කාලගුනය (2) කාළගුණය
(3) කාලගුණය (4) කාලගුණය

(9) (1) භාණ්ඩාගාරික (2) බාණ්ඩාගාරික
(3) බාණ්ඩාසාරික (4) භාණ්ඩාසාරික

(10) (1) ආරාදනා (2) ආරාධනා
(3) ආරාධණා (4) ආරාදණා

- **අංක 11 සිට 14 තෙක් ඇති එක් එක් ප්‍රකාශය සඳහා වඩාත් ගැළපෙන ප්‍රශ්නය තෝරන්න.**

(11) ගුවන් තොටුපොළ තියෙන්නේ අතන.

(1) ගුවන් තොටුපොළ තියෙන්නේ මොකද?
(2) ගුවන් තොටුපොළ තියෙන්නේ අතනද?
(3) ගුවන් තොටුපොළ තියෙන්නේ කොහේද?
(4) ගුවන් තොටුපොළ තියෙන්නේ මෙහෙද?

(12) අම්මා කන්නේ බත්.

(1) අම්මා කන්නේ අඹ ද?

(2) අම්මා කන්නේ මොනවා ද?

(3) අම්මා කන්නේ කෑම ද?

(4) අම්මා කන්නේ වතුර ද?

(13) සුජානිට අවුරුදු දොළහයි.

(1) සුජානිට වයස කොපමණ ද?

(2) සුජානිට වයස එච්චර ද?

(3) සුජානිට වයස කීය ද?

(4) සුජානිට වයස කොතන ද?

(14) වෛද්‍යවරයා රෝගියාව බලයි.

(1) වෛද්‍යවරයා බලන්නේ කාව ද ?

(2) වෛද්‍යවරයා බලන්නේ ඇයි?

(3) වෛද්‍යවරයා බලන්නේ කෝක ද?.

(4) වෛද්‍යවරයා බලනවා ද?

- **අංක <u>15 සිට 17 තෙක්</u> ප්‍රශ්නවල <u>නිවැරදිව අකුරු යෙදී ඇති පදය</u> තෝරන්න.**

| | | | | |
|---|---|---|---|---|
| (15) | (1) බාසාව | (2) භාෂාවා | (3) භාෂාව | (4) බාෂාව |
| (16) | (1) ගොග්කොළ | (2) ගොබ්කොළ | (3) ගොක්කොල | (4) ගොක්කොළ |
| (17) | (1) පාටමාලාව | (2) පාඨමාළාව | (3) පාඨමාලාව | (4) පාටමාළාව |

- **අංක <u>18 සිට 20</u> තෙක් ප්‍රශ්නවල <u>නොගැළපෙන පදය</u> තෝරන්න.**

| | | | | |
|---|---|---|---|---|
| (18) | (1) මාතර | (2) ගාල්ල | (3) රත්නපුරය | (4) දික්වැල්ල |
| (19) | (1) ලස්සන | (2) කැත | (3) අලංකාර | (4) සුන්දර |
| (20) | (1) වෙරළු | (2) කොහිල | (3) බතල | (4) ඉන්නල |

- **අංක <u>21 සිට 23</u> තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට <u>සමානාර්ථයක් දෙන පදය</u> තෝරන්න.**

| | | | |
|---|---|---|---|
| (21) | ලියුම | (1) ලිපිනය | (2) හසුන |
| | | (3) රාජකාරී | (4) ලේඛනය |
| (22) | සතිය | (1) මාසය | (2) යහළුවා |
| | | (3) මුදල් | (4) සුමානය |

(23) උත්සවය (1) උදය (2) උත්සාහය
(3) උලෙළ (4) උපකාරය

- **අංක <u>24 සහ 25</u> ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට <u>විරුද්ධාර්ථයක්</u> දෙන පදය තෝරන්න.**

(24) ජය (1) විජය (2) පරාජය
(3) ජයග්‍රහණය (4) විජයග්‍රහණය

(25) මිතුරා (1) සතුරා (2) යහළුවා
(3) මිත්‍රයා (4) යෙහෙළිය

- **අංක <u>26 සිට 28</u> තෙක් ප්‍රශ්නයෙ දී ඇති පින්තූරය සඳහා <u>වඩාත් ගැළපෙන ප්‍රකාශය</u> තෝරන්න.**

(26)

(1) බීම සඳහාය.
(2) ඉදිරියේ අවන්හලකි.
(3) බීමට සුදුසුය
(4) බීම පානය කිරීම තහනම්

(27)

(1) රෝහලක් ඉදිරියෙනි.
(2) ඖෂධ ලබා ගන්නා ස්ථානයකි.
(3) ඉදිරියේ නවතින්න.
(4) රෝහලක් ඉදිරියේ නැත.

(28)

(1) ස්ත්‍රීන් සඳහා පමණි.
(2) දුම්බීම තහනම්.
(3) දුම්බීමට අවසර ඇත.
(4) ඉදිරියෙන් හැරෙන්න.

- **අංක <u>29 සහ 30</u> ප්‍රශ්න වලට <u>ගැළපෙන පිළිතුර</u> තෝරන්න.**

(29) කිරි බී වැඩෙන සත්ත්වයින් හඳුන්වන්නේ,

(1) උභයජීවී (2) ක්ෂීරපායි (3) ජලජ (4) වනචාරි

(30) බෙහෙත් ලබා ගැනීමට යා හැකි වඩාත් සුදුසු ස්ථානයකි.

(1) පුස්තකාලය (2) පන්සල (3) සාප්පුව (4) රෝහල

- **අංක <u>31 සහ 32</u> ප්‍රශ්න වල දී ඇති වාක්‍යය දෙක <u>තනි වාක්‍යයක් ලෙස</u> නිවැරදිව සම්බන්ධ කර ඇති වාක්‍යය තෝරන්න.**

(31) කොටියා මුවාට පැන්නේය. සපා කෑවේය.

(1) කොටියා මුවාට පැන සපාය කෑවේය.
(2) කොටියා මුවාට පාන සපා කන්නට දිව්වේය.
(3) කොටියා මුවාට පැන සපා කෑවේය.
(4) කොටියා මුවාට පනිද්දී සපා කන්නට විය.

(32) තාත්තා පොළට ගියේය. බඩු ගෙනාවේය.

(1) තාත්තා පොළට ගොස් බඩු ගෙනාවේය.

(2) තාත්තා පොළට ගොස් බඩු ගෙනාවෝය.

(3) තාත්තා පොළට ගොස් බඩු ගෙන්නෝය.

(4) තාත්තා පොළට ගොස් බඩු ගෙනාවාය.

- **අංක 33 සිට 34 ප්‍රශ්න වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(33) මගේ කන් ............................ දුර්වලය.

(1) ඇහෙනවද (2) ඇසුණා (3) ඇහෙන්නෙ (4) ඇසීම

(34) පරිසරය ................................ පුද්ගලයාගේ ආයුෂ වැඩි කරයි.

(1) රකින (2) රැකීමට (3) රැකුණා (4) රැකුණු

- **අංක 35 ප්‍රශ්නයේ තද කළු අකුරින් මුද්‍රිත සංඛ්‍යාව නිවැරදිව ලියා ඇති පිළිතුර තෝරන්න.**

(35) මම ගඩොල් කැට **5492** ක් කැපුවෙමි.

(1) පන්දහස් අනූ දෙකයි (2) පන්දහස් හාරසීය අනූ දෙකයි

(3) පන්දහස් හාරසීය දෙකයි (4) පන්දහස් හාරසීය අනූනවයයි

- **අංක 36 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයේ ව්‍යාකරණානුකූලව නිවැරදිව ලියා ඇති වාක්‍ය තෝරන්න.**

(36) (1) මම පාසලට ආදරය කරමු. (2) මම පාසලට ආදරය කරන්නෙමු.

(3) මම පාසලට ආදරය කරමි. (4) මම පාසලට ආදරය කරති.

(37) (1) පාසල් බසය එනතුරු ළමයි බලා සිටියි.

(2) පාසල් බසය එනතුරු ළමයි බලා සිටියේය.

(3) පාසල් බසය එනතුරු ළමයි බලා සිටිති.

(4) පාසල් බසය එනතුරු ළමයි බලා සිටින්නෙමි.

(38) (1) මුවා වනයේ සැරිසරති. (2) මුවා වනයේ සැරිසරයි.

(3) මුවා වනයේ සැරිසැරුවෝය. (4) මුවා වනයේ සැරිසරන්නෝය.

(39) (1) අක්කා පොත කියෙව්වේය. (2) අක්කා පොත කියවති.

(3) අක්කා පොත කියවන්නේය. (4) අක්කා පොත කියෙව්වාය.

(40) (1) ළමයි කවි ලියති. (2) ළමයි කවි ලිව්වේය.

(3) ළමයි කවි ලියමි. (4) ළමයි කවි ලියයි.

(ලකුණු 1x40=40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION SOUTHERN PROVINCE

තෙවන වාර පරීක්ෂණය - 2021

10 ශ්‍රේණිය

# දෙවන බස සිංහල

නම/ විභාග අංකය :- ..............................................................................................................

## II පත්‍රය

- I කොටසේ අංක 1 හා 2 ප්‍රශ්න ඇතුළුව II කොටසින් එක් ප්‍රශ්නයක් ද III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න 05 කට පමණක් උත්තර ලියන්න.

## I කොටස

(01) දී ඇති මාර්ගෝපදේශ ආශ්‍රය කරගනිමින් පහත දැක්වෙන මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 100 ක පමණ රචනයක් ලියන්න.

(අ) බෝවන රෝගවලින් ආරක්ෂා වෙමු.
(I) හැඳින්වීම
(II) බෝවන රෝග හඳුන්වා දීම
(III) බෝවන රෝගවලින් ආරක්ෂාවන ආකාරය
(IV) සමාලෝචනය

(ආ) සුන්දර මගේ රට
(I) හැඳින්වීම
(II) රටේ තිබෙන සුන්දර දේවල් මොනවාද?
(III) ඒ තුළින් රට සුන්දර වන ආකාරය
(IV) සමාලෝචනය

(ඉ) ක්‍රීඩා උත්සවය
(I) හැඳින්වීම
(II) ක්‍රීඩා උත්සවය පවත්වන ආකාරය
(III) ඒ තුළින් ඇතිවන යහපත් ප්‍රතිඵල
(IV) සමාලෝචනය

(ඊ) පෑනක් කතා කරයි
(I) හැඳින්වීම
(II) තමා ගැන විස්තර පැවසීම
(III) තමාගෙන් ඇති ප්‍රයෝජන
(IV) සමාලෝචනය

(උ) අලුත් මිතුරෙකු හමු වූ දා
(I) හැඳින්වීම
(II) මිතුරා හමු වූ ආකාරය
(III) මිතුරා සමග විස්තර කතා කිරීම
(IV) සමාලෝචනය

(ලකුණු 20)

(02) දී ඇති පින්තූරය බලා ඒ ඇසුරින් අර්ථවත් වාක්‍ය 05 ක් ලියන්න. (වාක්‍යයක අවම වශයෙන් වචන 04 ක් වත් තිබිය යුතුය)



(ලකුණු 10)

## II කොටස

- අංක <u>03 හා 04</u> යන ප්‍රශ්න වලින් <u>එකකට</u> පමණක් පිළිතුරු සපයන්න.

(03) පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න වලට උත්තර ලියන්න.

සොම්නස හෝ සන්තාපය හමුවේ - සිහි වේ සිහි වේ අම්මා
කරුණා ගුණයේ සාරය සොයලා - නිමකල පිළිරුව අම්මා
ආදරයේ බල මහිමේ රතු ලේ සුදු වූවා - මෑණියගේ සෙනෙහසිනේ
රට ජාතිය හැදුවා

(1) මෙයින් කියවෙන්නේ කුමක් ගැනද?
(2) අම්මා ළඟ තිබෙන ගුණාංගය මෙහි දැක්වෙන්නේ කෙසේද?
(3) රට ජාතිය හැදුවේ කුමකින්ද?
(4) 'සොම්නස' යන පදයට සමානාර්ථ පදයක් ලියන්න.
(5) 'හැදුවා' යන පදයේ වර්තමාන ක්‍රියා පදය ලියන්න. (ලකුණු 10)

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පෙරහැරින් ගමන් ගත් රජු හා කුමාරයා තමන්ගේ රටට ඇතුළු වූ බව දැනගත් රටවැසියෝ වැළ නොකැඩී පැමිණියෝය. මේ පුවත රටේ ඈත ගම් දනව් වල පැතිර ගියේය. ආරංචිය ලැබුණු සෑම ප්‍රදේශයකම වැසියෝ තොරණ බැඳ කොඩිවැල් ඇද මංමාවත් සැරසිලි වලින් අලංකාර කළෝය.

(1) පෙරහැරින් ගමන් ගත්තේ කවුද?
(2) අලංකාර කළේ කෙසේද?
(3) පුවත පැතිරුණේ කොහේද?
(4) 'රජු' යන පදයට සමානාර්ථ පදයක් ලියන්න.
(5) 'අලංකාර' යන පදයට විරුද්ධාර්ථ පදයක් ලියන්න. (ලකුණු 10)

## III කොටස

- <u>5 හා 6</u> යන ප්‍රශ්න දෙකටම පිළිතුරු ලියන්න.

(05) (I) තම පාසලේ පැවැත්වෙන අවුරුදු උත්සවයට සහභාගී වීම සඳහා පැමිණෙන ලෙස දන්වා ප්‍රදේශවාසීන්ට ආරාධනා කිරීම සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

නැතහොත්

(II) ඔබේ ගමට යාමට ඇති මාර්ගය දැඩි ලෙස අබලන් වී ඇත. එම මාර්ගය නැවත සකස් කර දෙන ලෙස කියමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාට යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න. (ලකුණු 10)

(06) (I) පහත දැක්වෙන දෙමළ වාක්‍ය **සිංහලට** පරිවර්තනය කරන්න.

(1) ராஜா உயரமான மரமொன்றுக்கு ஏறினான்.
(2) நாங்கள் வாரத்தின் மத்தியில் ஒரு நாளில் வருவோம்.
(3) பாலயும் மயூரவும் நல்ல நண்பர்கள்.
(4) ஒன்றுபட்டால் உண்டு வாழ்வு.
(5) மாமாவின் வண்டியில் பயணத்தை ஆரம்பித்தார்கள்.

නැතහොත්

(II) කලකට පසු ඔබේ මිතුරෙකු නැවතත් ඔබට මුණගැසේ. ඔබ සහ මිතුරා අතර ඇති වන කතා බහ සංවාදයක් ලෙස ලියන්න.
(ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்

DEPARTMENT OF EDUCATION SOUTHERN PROVINCE

තෙවන වාර පරීක්ෂණය - 2021

10 ශ්‍රේණිය

# දෙවන බස සිංහල

## පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) 2 | (11) 3 | (21) 2 | (31) 3 |
| (2) 4 | (12) 2 | (22) 4 | (32) 1 |
| (3) 1 | (13) 3 | (23) 3 | (33) 4 |
| (4) 3 | (14) 1 | (24) 2 | (34) 1 |
| (5) 4 | (15) 3 | (25) 1 | (35) 2 |
| (6) 3 | (16) 4 | (26) 4 | (36) 3 |
| (7) 2 | (17) 3 | (27) 1 | (37) 3 |
| (8) 3 | (18) 4 | (28) 2 | (38) 2 |
| (9) 1 | (19) 2 | (29) 2 | (39) 4 |
| (10) 2 | (20) 1 | (30) 4 | (40) 1 |

ලකුණු(1x40=40)

### II පත්‍රය

(01) මාතෘකාවට අනුව රචනාව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 20)

(02) වාක්‍යය නිවැරදිව ලියා ඇත්නම් ලකුණු දෙන්න.
(වාක්‍ය ලිඛිත භාෂාවෙන් ලියා ඇත්නම් ලකුණු 02ක් ද කථන භාෂාවෙන් ලියා ඇත්නම් ලකුණු 01 ක් ද දෙන්න.) වාක්‍යයක අවම වශයෙන් වචන 04 ක් වත් තිබිය යුතුය.(ලකුණු 10)

(03) ප්‍රශ්නවලට අදාළව පිළිතුරු ලියා ඇත්නම් ලකුණු දෙන්න.
(උපුටාගෙන පිළිතුරු ලියා තිබේනම් ලකුණු ලබාදෙන්න.) (ලකුණු 10)
(I) අම්මා ගැන / මව් ගුණ (II) කරුණාව / ආදරය / ලේ කිරි කර දීම
(III) මෑණියගේ සෙනෙහසින් (IV) සතුට / ප්‍රීතිය
(V) හදනවා

(04) ඡේදයට අදාළව ප්‍රශ්නවලට පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)
(I) රජු හා කුමාරයා
(II) තොරණ බැඳ, කෙඩිවැල් ඇද, මංමාවත් සැරසිලි කර
(III) රටේ ඈත ගම් දනව් වල
(IV) රජතුමා
(V) කැත

(05) (I) නිවැරදිව ආරාධනා පත්‍රය ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 10)
(II) ආකෘතියට අනුව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)

(06) (I) දෙමළ වාක්‍යයක සිංහලයට නිවැරදිව පරිවර්තනය කර තිබේනම් ලකුණු ලබා දෙන්න.
(1) රාජා උස ගසකට නැග්ගේය.
(2) අපි වාරයේ මැද දවසක එනවා.
(3) පාලත් මයුරත් හොඳ යාළුවෝ.
(4) සමගිය බලය වේ.
(5) මාමාගේ වාහනයෙන් ගමන ආරම්භ කළේය (ලකුණු 10)
(II) සංවාදය නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)